# ඡායා රූ පිළිසඳර

2011 ජූලි / අගෝස්තු

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**

## නා මලට අමා පැන් බිඳක්.....



ඇය මිලින වී ජූලි මාසයට තෙමසක් ගත විය. කලා භූෂණ, කිවිපති, නන්දා හැගොඩ මැතිනිය වෙනුවෙන් ජූලි මස 14 වන පුන් පොහොය දින සවස 3.00 සිට 4.00 දක්වා සුමධුර ධර්ම දේශනාවක් සහිත පින්කමකි.

එදිනට සුදුවතින් සැරසී මල් පහන් රැගෙන (ගරු විල්සන් හැගොඩ ශූරීන්ගේ නිවස ඉදිරිපිට) ශ්‍රී සුරම්‍යාරාමයට පැමිණෙන ලෙස සංගමයේ සියලුම දෙනාට ආරාධනා කෙරේ.

## ආලෝකකරණ වැඩමුළුව

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ විද්‍යාර්ථීන් වෙනුවෙන් වාර්ෂිකව පවත්වන්නට යෙදෙන ආලෝකකරණ වැඩමුළුව මෙවර ද පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කොට ඇත. මෙයට සංගමයේ වසර තුනෙන් ම සාමාජික සාමාජිකාවන් අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු බව අධ්‍යාපන අධ්‍යක්ෂ මංගලනාත් උඩුකල මහතා දන්වා සිටී. මේ පිළිබඳ වැඩි විස්තර මංගලනාත් - 0718113191, දිනේෂ් - 0714286254, ඉලංගකෝන් - 0718305677 යන අයගෙන් ලබාගත හැකි ය.

## සංගමයේ 58 වන වාර්ෂික මහා සභා රැස්වීම



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 58 වන වාර්ෂික මහා සභා රැස්වීම 2011 ජූනි මස 12 වන දින පෙ.ව. 9.00 ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේ දී පැවැත්විණි. මේ සඳහා සංගමයේ සාමාජික සාමාජිකාවෝ දෙසීයකට ආසන්න සංඛ්‍යාවක් සහභාගී වූහ. එදින 2011/2012 වර්ෂය සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත්කර ගන්නා ලදී. මේ අනුව පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

| | |
|---|---|
| සභාපති | සුනිල් වික්‍රම මහතා |
| විධායක අධ්‍යක්ෂ | ශාන්ත ගුණරත්න මහතා |
| මුදල් අධ්‍යක්ෂ | මංගල එදිරිසිංහ මහතා |
| ලේඛකාධිකාරී | හසිත ලියනගේ මහතා |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | මංගලනාත් උඩුකල මහතා |
| ප්‍රකාශන අධ්‍යක්ෂ | කේ.ජී. කීර්තිරත්න මහතා |
| ප්‍රදර්ශන අධ්‍යක්ෂ | සම්පත් පීරිස් මහතා |
| සමාජ සේවා අධ්‍යක්ෂ | ප්‍රියන්ත අබේසුන්දර මහතා |
| සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ | නාරද අමරතුංග මහතා |

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# 'Image Tec 2011' ඡායාරූප උළෙල

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය දෙවන වරට සංවිධානය කළ දැවැන්ත ඡායාරූප උළෙල මෙවර කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදර්ශන ශාලා පරිශ්‍රයේ දී 'Image Tec 2011' නමින් 2011 ජූනි මස 24, 25 සහ 26 දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා 'Inco 2011' කර්මාන්ත සහ ඉංජිනේරු වෙළඳ ප්‍රදර්ශනය තුළ පවත්වන ලදී. 2010 නොවැම්බර් මස කොළඹ SLECC හිදී පවත්වනු ලැබූ 60වන සංවත්සර ප්‍රදර්ශනයේ දී ලැබූ අති විශාල සාර්ථකත්වය මත බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි නැවතත් මෙවැනි ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සූදානම් කළ අතර, ඒ සඳහා Inco 2011 සමග අත්වැල් බැඳ ගැනීමට සංගමයට හැකි විය. වාර්ෂිකව පැවැත්වෙන අති දැවැන්ත කර්මාන්ත සහ ඉංජිනේරු වෙළඳ ප්‍රදර්ශනයක් වූ මෙම Inco ප්‍රදර්ශනයට අති විශාල ජනකායක් සහභාගී වූහ.

මෙවර ද පසුගිය 60වන සංවත්සර ප්‍රදර්ශනයේ දී  මෙන් දිවයිනේ ඡායාරූපකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ආයතන බොහෝ ප්‍රමාණයක් අප සමග එක් විය.

ගියවර මෙන් ම මෙවර ද ප්‍රදර්ශනය සාර්ථක කරගැනීමට සංගමයේ සාමාජිකයින්ගෙන් ලද සහයෝගය ඉතා අගේ කොට සලකන අතර, ඉදිරියේ දීත් මෙවැනි ප්‍රදර්ශන සාර්ථක කර ගැනීම සඳහා සාමාජික ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමු.







## සුභ මංගලම් ....

- සංගමයේ තුන්වන වසර ඉගෙනුම ලබන චන්දන සුමිත් කුමාර මහතා චලනි ඉරේෂා මෙනවිය සමග අතිනත ගත්තා ය. එම දෙපලට සංගමයේ සුභ පැතුම්......
- සංගමයේ තෙවන වසර ඉගෙනුම ලබන වෙනුර ද සිල්වා මහතා පසුගියදා යුග දිවියට ඇතුලත් විය. ඔහුටත් ඇයටත් සංගමයේ සුභ පැතුම්....
- අප සංගමයේ සාමාජික ප්‍රෂාන් මහතා අමාලි මෙනවිය සමග අතිනත ගත්තේය. එම දෙපලට සංගමයේ සුභ පැතුම්....

## අපේ ශෝකය...

- අප සංගමයේ සාමාජික එච්.පී. චතුලන්ද මහතාගේ මාමණ්ඩිය වූ එච්.එස්. පෙරේරා මහතා පසුගියදා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව අප සංගමයේ ශෝකය මෙසේ පළකර සිටිමු.
- සංගමයේ සාමාජික ලාල් හේවගේ මහතාගේ පියාණන් වූ එච්.කරුණාදාස මහතා පසුගියදා අභාවප්‍රාප්ත විය. එතුමා වෙනුවෙන් සංගමයේ ශෝකය මෙසේ පළකර සිටිමු.
- අප සංගමයේ හිටපු සභාපතිවරයෙකු වූ කංචන මාරසිංහ මහතාගේ මාමණ්ඩිය අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව සංගමයේ කණගාටුව මෙසේ පළකරමු.
- සංගමයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වූ ශාන්තිලාල් ප්‍රනාන්දු මහතාගේ දයාබර පියාණන් නොබෝදා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳව අපගේ කණගාටුව මෙසේ පළකර සිටිමු.

## නිදුක් නිරෝගී සුවය ලැබේවා....

- කඳුරට ඡායාරූප කලා සංගමයේ සභාපතිවරයා වූ බරිගම වැරැල්ලගම ඩී.ජී. රණතුංග මහතා කලක සිට රෝගාතුරව සිටී. එතුමාට සංගමය වෙනුවෙන් නිදුක් නිරෝගී සුවය පතමු.
- සංගමයේ සාමාජිකා සුජාතා පතිරාජ මහත්මියගේ මව රෝගාතුරව සිටී. ඇයට නිදුක් නිරෝගී සුවය පතමු.

## සාමාජිකත්වය රැකගනිමු

දෙවසරකට වැඩි කලක් සාමාජික මුදල් නොගෙවූ සියලු දෙනාගේ සාමාජිකත්වය අහෝසි කිරීමට සිදුවේ. එබැවින් ඔබගේ හිඟ සාමාජික මුදල් වේ නම් එය පියවා සාමාජික වරප්‍රසාද රැක ගැනීමට කඩිනමින් ක්‍රියාත්මක වන මෙන් මෙයින් ඉල්ලා සිටිමු. එහෙයින් හිඟ සාමාජික මුදල් වේ නම් මුදලින්, චෙක්පතකින් හෝ ඉරු දින සවස මහාබෝධි විද්‍යාලයට පැමිණීමෙන් ද එය ගෙවිය හැකි ය. මේ පිළිබඳ විමසුමක් වෙතොත් මුදල් අනු කමිටු ප්‍රධානී සුනිල් ලියනගේ (077-0494150) මහතා අමතන්න.

පිළිසඳරට **වෙහෙස මහන්සිය**
ප්‍රකාශන අධ්‍යක්ෂ - කේ.ජී. කීර්තිරත්න
ශාන්ත ගුණරත්න
නාරද අමරතුංග
සුනිල් ලියනගේ

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
The National Photographic Art Society of Sri Lanka

# මුදල් පරිපාලන නිර්ණායක

**අරමුණු**

සංගමයේ මුදල් කටයුතු ව්‍යවස්ථානුකූල වූත්, සංගමයේ අභිවෘද්ධියට හේතුකාරක වන්නා වූත් ක්‍රමවේදයකට අනුව මෙහෙයවීම මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

**නිර්දේශ**

**1. මුදල් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය**

1.1. රජයේ ලියාපදිංචි පුණ්‍යායතන සඳහා රජය මගින් නිර්දේශිත කොන්දේසිවලට අනුකූල වන පරිදි සාමාජික මුදල් හා පරිත්‍යාග එක්රැස් කිරීම සහ එකී කොන්දේසි ප්‍රකාර පරිහරණය පිළිබඳ ප්‍රධාන වගකීම මුදල් අධ්‍යක්ෂවරයා සතු ය.

1.2. සංගමයේ ගිණුම්වල මුදල් සහ අත්පිට මුදල් (Petty Cash) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි කාර්යක්ෂම ලෙස මෙහෙයවීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීම වෙයි.

1.3. සෑම නිල වර්ෂයක් ආරම්භයේ දී ම සංගමයේ ආර්ථික වටිනාකම් ඉහළ නැංවීම සඳහා වන දළ සැලැස්මක් මුදල් අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු ය.

1.4. සංගමයේ වත්කම් වැඩිදියුණු කිරීම පිණිස එක් මූල්‍ය ප්‍රවර්ධන වැඩසටහක් හෝ නිල වර්ෂයක් තුළ ක්‍රියාවට නැංවීමට මුදල් අධ්‍යක්ෂවරයා පියවර ගත යුතු ය.

1.5. විවිධ ව්‍යාපෘති සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව පරිදි ඒ ඒ අධ්‍යක්ෂවරුන් වෙත අත්තිකාරම් මුදල් ලබාදීමේ බලය මුදල් අධ්‍යක්ෂවරයා සතු ය.

1.6. එකී සෑම ගිණුමක් ම විධිමත් ලෙස පියවීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීමක් වන අතර, සෑම ව්‍යාපෘතියක් ම මූල්‍ය වශයෙන් සංගමයට අවාසිදායක නොවන සේ මෙහෙයවීමට උපදෙස් දීම මුදල් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරයයි.

1.7. සෑම මුදල් වර්ෂයකට ම අදාළ ගිණුම් නිසි පරිදි ලේඛනගත කොට, වරලත් ගණකාධිකාරීවරුන් ලවා විගණනයට පාත්‍ර කොට, ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම මුදල් අධ්‍යක්ෂවරයාගේ වගකීමකි.

1.8. වාර්ෂික සාමාජික මුදල් අයකර ගැනීම, දෙවසරකට වැඩි කාලයක් මුදල් නොගෙවූ අය සෑම ලිත් වර්ෂයක් අවසානයේ ම සාමාජික නාමලේඛනයෙන් ඉවත් කිරීම සහ ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ වගකීම මුදල් අධ්‍යක්ෂවරයාට පැවරේ. මේ සම්බන්ධව අදාළ සාමාජිකයාට ලිඛිත ව දැනුම් දිය යුතු ය.

**2. සෙසු අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය**

2.1. තම අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මුදල් වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගත යුතු අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි අත්තිකාරම් මුදලක්, මුදල් අධ්‍යක්ෂ වෙතින් ඉල්ලා සිටිය හැකි ය.

2.2. තමන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධ මුදල් පිළිබඳ වගකීම අදාළ අධ්‍යක්ෂවරයා විසින් දරනු ලබන අතර, එම වාර්තාවල මුල් පිටපත් මුදල් අධ්‍යක්ෂවරයාට භාර දී එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

2.3. සංගමයේ නමින් ක්‍රියාත්මක කරන මුදල් උපයන ව්‍යාපෘති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව ක්‍රියාවට නැගීම නොකළ යුතු වේ.

2.4. මුදල් හා සම්බන්ධ වන සෑම ව්‍යාපෘතියක් ම ව්‍යාපෘති සැලසුමේ දින වකවානු පරිදි අවසන් කිරීමට සහ ගිණුම් පියවීමට විශේෂ උනන්දුවකින් කටයුතු කළ යුතු ය.

**3. සාමාජිකයින්ගේ කාර්ය භාරය**

3.1. සංගමය මගින් එහි වත්කම් ප්‍රවර්ධනය සහ විශේෂ කාර්ය සාධනය උදෙසා ක්‍රියාත්මක කරන මූල්‍ය සංවර්ධන කටයුතු සඳහා සිය උපරිම දායකත්වය ලබාදීම සාමාජික වගකීම වේ.

3.2. සංගමය වෙනුවෙන් පෙනී සිටිමින් බාහිර පාර්ශවයන් හා කරන ගනුදෙනු නියමිත උපදෙස්වලට යටත් ව සහ අදාළ අධ්‍යක්ෂවරයාගේ අනුදැනුම පරිදි සිදුකිරීමට වග බලාගත යුතු ය.

**4. විගණකවරුන්ගේ කාර්ය භාරය**

4.1. වාර්ෂික මුදල් පරිහරණයට අදාළ ව මුදල් අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලබන දත්ත පදනම් කොටගෙන සකස් කෙරෙන වාර්ෂික මුදල් වාර්තාව විගණනය කොට ඉදිරිපත් කිරීම විගණකවරුන්ගේ කාර්යභාරයයි.

4.2. එය සකස් කොට අදාළ මහා සභා රැස්වීමට පෙරාතුව මුදල් අධ්‍යක්ෂවරයා වෙත භාර දිය යුතු වේ.

## සතුන් වත්තේ වාර්ෂික වැඩමුළුව



මේ සඳහා සියයකට ආසන්න සාමාජික සාමාජිකාවන් සංඛ්‍යාවක් සහභාගී වූහ. උදෑසන 9.00 පමණ සිට සවස 5.00 දක්වා විවිධ අරමුණු ඡායාරූපයට නැගීමට හැකි විය. දිවා කාලයේ රැස් වූ සැම ඔවුනොවුනට පැවති ගැටලු ගැන කථාබහ කළහ. මෙම වැඩමුළුවට සංගමයේ සභාපතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන් කිහිප දෙනෙකුද සහභාගී වූහ.

---

## කතරගම පාද චාරිකාව



වාර්ෂිකව පැවැත්වෙන කතරගම පාද චාරිකාවට මෙවර අප සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දෙදෙනෙකු ඇතුලු සංගමයේ සාමාජික සාමාජිකාවන් 07 දෙනෙකු පමණ සහභාගී විය.

මේ මගින් සිංහල දමිල ජනතාවගේ අදහස් හුවමාරු කර ගැනීමටත් ඔවුන්ගේ සිරිත් විරිත් ගැන අධ්‍යයනය කිරීමටත් ඔවුන්ට හැකි විණි.

ත්‍රිකුණාමලේ තංගරාජා මහතාගේ ආරාධනයෙන් මෙම චාරිකාවට සංගමයේ සමාජසේවා හා සුභ සාධන අධ්‍යක්ෂ ප්‍රියන්ත අබේසුන්දර මහතාත් ප්‍රකාශන අධ්‍යකෂ කේ.ජී. කීර්තිරත්න මහතාත්, එදිරිතිලක, අනෝජා, රත්නා, ඉලංගකෝන්, නෙරන්ජන්, මංජුලා බාලසූරිය ඇතුලු තවත් හිතවතුන් කිහිප දෙනෙක් සහභාගී වූහ.

දින 6 ක පා ගමනින් ඡායාරූප ගැනීම මෙන්ම විවිධ වූ අත්දැකීම් රැසක්ම ලබා ගැනීමට හැකි විය. පානම සිට පා ගමනින් සාමිමලේටත් එතනින් ඔකඳ දේවාලයටත්, ඉන් පසුව කුඹුක්කන් ඔය පසුකර යාල කලාප අංක 2 හරහා කතරගම පුද බිම කරා ලඟා විය.

## මාසික ඡායාරූප තරග ප්‍රතිඵල

### අප්‍රේල් 24 මාසික ඡායාරූප තරගය

**වර්ණ අංශය**

1 වන ස්ථානය - එම්. ඒ. ඉඳුනිල් ජීවන්ත
2 වන ස්ථානය - තිසල් කළුආරච්චි
3 වන ස්ථානය - මොරිස් කුමාර
4 වන ස්ථානය - එම්. ඒ. ඉඳුනිල් ජීවන්ත
5 වන ස්ථානය - ප්‍රීති මෙන්ඩිස්



වර්ණ ඃ 1 වන ස්ථානය - එම්. ඒ. ඉඳුනිල් ජීවන්ත

**කලුසුදු අංශය**

1 වන ස්ථානය - එස්. සුන්දර රාජන්
2 වන ස්ථානය - ජේ. ඒ. ජයලත් ප්‍රේමවංශ
3 වන ස්ථානය - එල්. එන්. ජී. සී. නිලන්ත කුමාර
4 වන ස්ථානය - දර්ශන බෙන්ජමින්
5 වන ස්ථානය - මොරිස් කුමාර



කලු සුදු ඃ 1 වන ස්ථානය - එස්. සුන්දර රාජන්

**තරග විනිශ්චය**

එච්. එම්. ආර්. පෙරේරා මහතා, ප්‍රියන්ත අමරසිංහ මහතා සහ කේ. ජී. කීර්තිරත්න මහතා

**ත්‍යාග අනුග්‍රහය**

- කළුබෝවිල සේයාකලර් ඩිජිටල් වර්ණ රසායනාගාරය
- එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා